# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

# ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 නොවැම්බර් මස 10 වැනි දින

## II වන කොටස

## අතිරේකය

**(2023.11.10 දින නිකුත් කරන ලදී)**


# කාලාවරෝධ (සංශෝධන)

**(68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 6.00 | තැපැල් ගාස්තුව : රු. 50.00

*මෙම ගැසට් අතිරේකය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් දේපළක යම් උකසක් මත හෝ මුදල් ගෙවීම සඳහා වූ යම් බැඳුම්කරයක් මත ගෙවීමට නියමිත යම් මුදලක් අයකර ගැනීම සඳහා වූ යම් නඩුකරයක්, ණයකරුට දැන්වීමක් කළ දිනයේ සිට අවුරුදු දහයකට පසුව කාලාවරෝධ විය යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.-ඕ. 63/2017

## (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

1. (1) මේ පනත 2023 අංක  දරන කාලාවරෝධ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

*68 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම*

2. (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 5 වන වගන්තියේ "ඒ නඩුව ඒ කාලසීමාව ඉකුත් වීමෙන් අවුරුදු දහයක් ඇතුළත ආරම්භ කරන්නේ නම් මිස" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය තෙක් ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "ඒ නඩුව ණයකරුට දැන්වීමක් කළ දිනයේ සිට අවුරුදු දහයක් ඇතුළත ආරම්භ කරන්නේ නම් මිස පවත්වා ගෙන යා නොහැකි විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී